# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය-2015

## Primary Piriven Year End Term Test - 2015

1 වසර / Grade 1

සියලු ම හිමිකම් ඇවිරිණි)
All Rights Reserved)

**සිංහල**

**SINHALA**

කාලය : පැය 02 යි.
Time : Two hours.

පළමු වැනි ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න 06කට පිළිතුරු ලියන්න.

01) පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරා ගෙන වචන 100කට නොඅඩු වාක්‍ය රචනයක් ලියන්න.

i. අපේ පන්සල.
ii. පොසොන් උත්සවය.
iii. දුටුගැමුණු මහ රජතුමා.
iv. සුරකිමු පරිසරය.
v. මා පිරිවෙනට පැමිණි පළමු දින.

(ලකුණු 25)

02) (අ) "ත" වර්ගයට අයත් සියලු අකුරු ලියා දක්වන්න.

(ලකුණු 05)

(ආ) මිශ්‍ර සිංහල හෝඩියේ ස්වර අක්ෂර සියල්ල ලියා දක්වන්න.

(ලකුණු 05)

(ඇ) පහත සඳහන් පිල්ලම් නම් කරන්න.

ැ , ි , ු , ් , ා

(ලකුණු 05)

03) (අ) පහත සඳහන් පදවල බහුවචන පද ලියන්න.
මිනිසා , බයිසිකලය , මේසය , බසය , කුරුල්ලා. (ලකුණු 05)

(ආ) පහත සඳහන් පදවලට විරුද්ධාර්ථ පද ලියන්න.
දුප්පත් , සුදන , යන , අහස , සතුරු. (ලකුණු 05)

(ඇ) පහත සඳහන් පදවලට සමානාර්ථ පදය බැගින් ලියන්න.
මව , ගස ,ගෙය ,ඇස ,මාර්ගය. (ලකුණු 05)

04) (අ) පහත සඳහන් වචනවල හිස්තැන් සම්පූර්ණ කරන්න.

i. ව.....දා.....ය.
ii. මො......රාග......
iii. ......ත්......ර......ම.
iv. ති....... ......ටුවා ........
v. ......රි......ල්......ත්ත.

(ලකුණු 05)

(ආ) සුදුසු වචනය වරහන් තුළින් තෝරා වාක්‍ය සම්පූර්ණ කරන්න.

i. .......... පොත පාඩම් කරමි. (මම/අපි)
ii. ................ පොත් කියවයි.(ඔහු/ඔවුහු)
iii. නුඹලා රූපවාහිනිය ................ (බලහු / බලති)
iv. ඔවුහු විභාගයෙන් ඉහළින් සමත් ...........(වූහ/විය)
v. ................. විභාගයට සූදානම් වෙති. (ළමයා/ළමයි)
vi. අපි පෙරහැර ......................(බැලුවෙමි/ බැලුවෙමු )
vii. අම්මා මල්ලීට බත් ...................(කැව්වාය/කැව්වේය)
viii. ................ නංගී සමග පොළට ගියාය.(අක්කා/තාත්තා)
ix. ....................... පාරේ වැඩ කරති. (කම්කරුවෝ/කම්කරුවා)
x. ගුරුවරු දරුවන්ට හොඳින් .................... (උගන්වයි/උගන්වති)

(ලකුණු 10)

05) (අ) පහත සඳහන් වචන අකාරාදී පිළිවෙළට ලියන්න.
i) බයිසිකලය , ii) කාරය , iii) නැව , iv) ගුවන් යානය , v) දුම්රිය , vi) ත්‍රීරෝද රථය ,
vii) ඩක්කුව , viii) ට්‍රයිසිකලය , xi) ඔරුව , x) පාරුව. (ලකුණු 05)

(ආ) පහත සඳහන් වචන යොදා අදහස පැහැදිලි වන සේ වාක්‍යය බැගින් ලියන්න.
i) තරුව , ii) දේදුන්න , iii) සාගරය , iv) ගුරුතුමා , v) මගියා (ලකුණු 05)

(ඇ) පහත සඳහන් පදවල ස්ත්‍රී ලිංග පද ලියන්න.
i) බල්ලා , ii) බළලා , iii) කුකුළා , iv) හිඟන්නා , v) තරුණයා. (ලකුණු 05)

06) (අ) අකර්මක ක්‍රියා පද 03ක් සහ සකර්මක ක්‍රියා පද 02ක් ලියන්න. (ලකුණු 05)

(ආ) පහත සඳහන් කවි සම්පූර්ණ කරන්න.
ii. මස් කැටියක් ගත් උකුසෙකු අහසේ.
iii. බිම ඉඳ සිට කී බණ නාසන්නේ. (ලකුණු 10)

07) (අ) සචේතනික නාම පද මුලට යොදා වාක්‍ය පහක් (05) ලියන්න.

(ලකුණු 05)

(ආ) පහත සඳහන් කවියේ අදහස සරල බසින් ලියන්න.

"අත්වැඩ පරවැඩ සමව සිතන්නේ.
මෙත් සිත සව්සත කෙරෙහි කරන්නේ.
එත් බැරිනම් තොප සසර ගෙවන්නේ.
මොක්පුර සැප කෙලෙසකද ලබන්නේ. (ලකුණු 10)

08) මාර්ටින් වික්‍රමසිංහ විසින් රචනා කළ මඩොල්දූව නවකතාවේ ඔබ වඩාත් සිත්ගත් චරිතයක් නම් කර, එසේ සිත් ගැනීමට හේතු කවරේදැයි දක්වන්න. (ලකුණු 15)